# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2192/36 - 2020 සැප්තැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2020.09.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ආයෝජන අවස්ථා පුළුල් කිරීම, දේශීය කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, දේශීය ආහාර භෝග නිෂ්පාදනය සඳහා රජයේ ඉඩම් ප්‍රශස්ථ ලෙස කළමනාකරණය කිරීම රජයේ ප්‍රමුඛ අරමුණයි. එම අරමුණ පෙරදැරිව පළමු පියවර ලෙස ශ්‍රී ලාංකික පුරවැසියන්ට නිරවුල් බිමක හිමිකම තහවුරු කිරීම සඳහා විධිමත් ලේඛනයක් නොමැතිව රජයේ ඉඩම් සංවර්ධනය කර ඇති පුද්ගලයන් වෙත කඩිනමින් හා විනිවිද භාවයකින් යුතුව නීත්‍යානුකූල ලේඛන ලබා දීමට සැලසුම් කර ඇත. ඒ සඳහා රජයේ ඉඩම් අවිධිමත්ව භුක්ති විඳින පුද්ගලයන් ක්‍රමවත්ව හඳුනාගෙන, එම පුද්ගලයන්ගේ සුදුසුකම් පරීක්ෂා කර බලා නීත්‍යානුකූල ලේඛනයක් ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

**කිසිදු ලියවිල්ලක් ලේඛනයක් නොමැතිව රජයේ ඉඩම්වල පදිංචි හෝ සංවර්ධනය කර ඇති පුද්ගලයන් වෙත නීත්‍යානුකූල ලේඛන ලබාදීම කඩිනම් කිරීම**

රජයේ ඉඩම් කොටසක ස්ථිර නිවාස ඉදිකර, කෘෂිකාර්මික කටයුතු පවත්වාගෙන යන හෝ ඕනෑම සංවර්ධන කටයුත්තක් සිදු කරමින් භුක්ති විඳින පුද්ගලයන් සඳහා නීත්‍යානුකූල ලියවිලි ලබා දීමට සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි (විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීමට නියමිත කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක හැර) සුදුස්සන් තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

ඔබගේ අයදුම්පත පහත ආකෘතිය පරිදි නිසි ලෙස සම්පූර්ණ කර ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත හෝ ග්‍රාම නිලධාරී/ක්ෂේත්‍ර නිලධාරී වෙත භාරදීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

**අයදුම්පත් භාරගන්නා කාලය 2020.09.30 දිනෙන් අවසන් වේ.**

එසේ ඉදිරිපත් වන අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් විසින් ලියාපදිංචි කරගනු ලබන අතර ලියාපදිංචි කරගත් අයදුම්කරුවන් සඳහා **2020.11.01** සිට **2020.11.21** අතරතුර දිනයන් හි ප්‍රාදේශීය ලේකම් දන්වන දිනක දී ඉඩම් කච්චේරි පවත්වනු ලැබේ.

**ආර්. එම්. සී. එම්. හේරත්,**
ඉඩම් කොමසාරිස් ජනරාල්,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව.

2020 සැප්තැම්බර් මස 10 වැනි දින,

1A - G 32844 — 25 (2020/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ආදර්ශ අයදුම් පත්‍රය

**විධිමත් ලේඛනයක් නොමැතිව රජයේ ඉඩම් සංවර්ධනය කර ඇති පුද්ගලයන් වෙත විධිමත් ලේඛන ලබාදීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය**

(සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2020.09.30 දිනට පෙර ග්‍රාම නිලධාරී/ ක්ෂේත්‍ර නිලධාරී වෙත භාර දෙන්න)

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ................................ ග්‍රාම නිලධාරී වසම : .............................

**01. පෞද්ගලික තොරතුරු**

1.1. ඉල්ලුම්කරුගේ නම : ..............................................................................................................................

1.2. ලිපිනය : ..........................................................................................................................................

1.3. උපන් දිනය : ................................

1.4. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

1.5. විවාහක/ අවිවාහක බව : ..................................................

1.6. විවාහක නම් දරුවන් ගණන: ............. විවාහක දරුවන් ගණන : ............. අවිවාහක දරුවන් ගණන : .........

1.7. අයදුම්කරුගේ රැකියාව : ............................................................

1.8. පවුලේ සාමාජිකයන්ගේ විස්තර :

| නම | අයදුම්කරුට ඇති ඥාතීත්වය | රැකියාව/ වෘත්තිය | වාර්ෂික ආදායම | වයස |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

1.9. පවුලේ මාසික ආදායම : ...........................................................
(අයදුම්කරුගේ, කලත්‍රයාගේ, අවිවාහක දරුවන්ගේ ආදායම ද ඇතුළුව)

1.10. දුරකථන අංකය : ස්ථාවර : ........................... ජංගම : ..........................................

1.11. විද්‍යුත් තැපැල් ලිපිනය (තිබේ නම් සඳහන් කරන්න) : .......................................

**02. භුක්ති විඳින ඉඩමේ තොරතුරු**

2.1. ඉඩමේ ප්‍රමාණය :

හෙක්ටයාර් ................./ අක්කර : ...................... රූඩ් : ....................... පර්චස් : .......................

2.2. ඉඩම භුක්ති විඳි කාලය : ..........................................

2.3. ඉඩම අවශ්‍ය කාරණය :

පදිංචිය ☐

කෘෂිකර්මය ☐

වාණිජ ☐

වෙනත් ☐ ........................ (සඳහන් කරන්න)

**03. වෙනත් ඉඩම්වල අයිතිය සම්බන්ධව**

3.1. ඉහත සඳහන් ඉඩම්වලට අමතරව ඔබට රජයෙන් ලැබුණු සහ සින්නක්කර ඉඩම් කොපමණ තිබේ ද?

I. රජය : හෙක්ටයාර්............../ අක්කරː .............. රූඩ්ː ............ පර්චස්ː ................

II. සින්නක්කර : හෙක්ටයාර්............../ අක්කරː .............. රූඩ්ː ............ පර්චස්ː ................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, යම් හෙයකින් මෙම ඉඩම් කොටස ලබා ගැනීම සඳහා මා සුදුස්සකු වීමෙන් පසු මා විසින් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත් එම තෝරා ගැනීම අවලංගු කිරීමට යටත් වන බවත්, එසේ වුවහොත් එම ඉඩම් කොටස නැවත රජයට භාර දීමට එකඟ වන බවත්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන නීත්‍යානුකූල කටයුතු සඳහා මා මෙයින් එකඟ වෙමි.

....................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : .............................

**II කොටස**

(ඉල්ලුම්කරුට භාරදීම සඳහා)

ඉල්ලුම්පත්‍ර අංකය : .................................

ඉල්ලුම්කරුගේ නම : ................................................................................

| ග්‍රාම නිලධාරී වසමේ නම හා අංකය | අනු අංකය |
|---|---|
| | |

ඉල්ලුම්පත්‍රය .................................... දින භාර ගතිමි.

............................................

(ග්‍රාම නිලධාරී/ ක්ෂේත්‍ර නිලධාරී අත්සන හා නිල මුද්‍රාව)

ආර්. එම්. සී. එම්. හේරත්,
ඉඩම් කොමසාරිස් ජනරාල්,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව.

2020 සැප්තැම්බර් මස 10 වැනි දින,

09 - 584

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.